# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/HO/5/MF/01 | ඔබේ අංකය<br>உமது இல<br>Your No ............ | දිනය<br>திகதி<br>Date 2021.05.06 |

සියලුම විධායක කමිටු /පාලක මණ්ඩල සභාපතිවරුන්,

සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන්.

**<u>Covid - 19 ව්‍යවසනකාරි තත්ත්වය හමුවේ බැංකු කළමනාකරණය කිරීම සම්බන්ධ උපදෙස්</u>**

Covid - 19 ව්‍යවසනකාරි තත්ත්වය රටපුරා ව්‍යාප්ත වෙමින් පවතී. මේ හේතුවෙන් සාමාන්‍ය ජන ජීවිතය ද නියමිත පරිදි පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත.

02. මේ සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව මීට පෙර ඔබ වෙත උපදෙස් ලබා දී ඇත. එම උපදෙස් ඒ ආකාරයෙන්ම තවදුරටත් පිළිපැදිය යුතුය. ඒ වගේම සෞඛ්‍ය අංශ විසින් විටින් විට ලබාදෙන උපදෙස් ද ඒ ආකාරයෙන්ම පිළිපැදිය යුතුය.

03. පවතින වසංගත තත්ත්වය තුළ ජනතාව ඒකරාශීවීම විශාල ගැටළුවක් බවට පත්ව තිබේ. ඒ හේතුවෙන් සමෘද්ධි ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ප්‍රතිලාභීන් විශාල වශයෙන් බැංකුවලට එකතුවීමද ගැටළු සහගතය. එවැනි අවදානම් තත්ත්වයක් තුළ බැංකුවට ප්‍රතිලාභීන් නොගෙන්වා වසමට, ගමට, නිවසට ගොස් සමෘද්ධි ප්‍රතිලාභ ගෙවීම් කටයුතු පෙර අවස්ථාවේ සිදුකල ආකාරයට සිදුල හැකිය. එක් නිලධාරියෙකුට එක් අවස්ථාවක උපරිම රු. 300,000.00 ක පමණ මුදලක් වසමට ගෙන ගොස් ගෙවීම් කිරීමට අවසර ඇත. මෙය ඉතා සුරක්ෂිතව විනිවිදභාවයෙන් සිදු කල යුතුය.

04. ඒ වගේම මෙම වසංගත තත්ත්වය හමුවේ, මූලස්ථාන, සමෘද්ධි බැංකු සමිති හා බැංකු වල දෙපාර්තමේන්තු නිලධාරියෙකුට Covid - 19 වෛරසය ආසාධනය වුවහොත් එම නිලධාරියාට (ඔහුගේ පවුලට) රු. 10,000/- ක අත්‍යවශ්‍ය ආහාර මල්ලක් ලබාදිය යුතුය. එය පහත පරිදි ලබාදිය යුතුය.

05. ක්ෂේත්‍රයේ හා සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා ප්‍රජාමූල බැංකුවේ ඇති සේවක අභිප්‍රේරණය සහ සුභසාධන සඳහා වෙන් කිරීම් ගිණුම (කේත අංක 4206) භාවිතා කල යුතුය. ගිණුම් සටහන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| සේවක අභිප්‍රේරණ සහ සුභසාධන ගිණුම (4206) | - | හර |
| මුදල් ගිණුම | - | බැර |


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

මූලස්ථාන හා බැංකු සමිති නිලධාරීන් සඳහා බැංකු සමිතියේ තිබෙන සේවක දිරි දීමනා ගිණුම (කේත අංක 9505) භාවිතා කල යුතුය. ගිණුම් සටහන් පහත පරිදි වේ.

සේවක දිරි දීමනා ගිණුම (9505) - හර
මුදල් ගිණුම - බැර

සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල විගණන වාර්තා ආවරණ අනුමැතියට යටත්ව මෙම ගෙවීම් කිරීමට කටයුතු කරණ ලෙස වැඩිදුරටත් සඳහන් කරමි.

06. බැංකු ජාලගත කිරීමේ කටයුතු මේ වන විට අවසන් අදියරට පැමිණ ඇත. 2021.04.30 දිනට පෙර බැංකු පරිගණකගත කිරීමේ කටයුතු අවසන් කරන ලෙස බැංකු කළමනාකරණ මණ්ඩලය උපදෙස් ලබා දී ඇත. එහෙත් සමහර බැංකු හා බැංකු සමිති 2021.04.30 දින එම කටයුතු අවසන් කර නොමැත. මේ සම්බන්ධව විවිධ හේතු එම බැංකු හා බැංකු සමිති විසින් ඉදිරිපත් කර ඇත.

07. බැංකු ජාලගත කිරීමේ කටයුතු සම්පූර්ණයෙන් 2021.05.31 දිනට පෙර අවසන් කරන ලෙස විෂය භාර ගරු රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමා හා අතිගරු ජනාධිපතිතුමා අප දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී ඇත. ඒ අනුව මෙම කටයුතු 2021.05.31 දිනට පෙර අවසන් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. එසේම එදිනට පෙර එවකටද අවසන් නොකරන බැංකුවල හා බැංකු සමිතිවල නිලධාරීන් සඳහා ලබාදෙන අමතර දීමනා අත්හිටුවීමට ද සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමකාරණ මණ්ඩලය අප වෙත උපදෙස් ලබා දී ඇත.

08. තවද, සමෘද්ධි බැංකු හා බැංකු සමිති මෘදුකාංගය වෙනුවෙන් අය කරනු ලබන සේවා ගාස්තු ගෙවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ගෙන්වා ගැනීමට අංක DSD/HO/5/MF/01/චක්‍රලේඛ හා 2021.03.25 දිනැති ලිපිය මගින් ඔබ වෙත උපදෙස් ලබා දී ඇත. මෙතෙක් ප්‍රධාන කාර්යාලයට මුදල් එවා නොමැති සමෘද්ධි බැංකු හා බැංකු සමිති ඉතා කඩිනමින් එම මුදල් පෙර ලබා දී ඇති උපදෙස් පරිදි එවීමට කටයුතු කල යුතුය.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන් /දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස හා අ.ක.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
4. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස
5. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස. සහ අ.ක.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන් ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස. හා අ.ක.ස.
7. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.